CPA

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ පනවන ලද නව රෙගුලාසි පිළිබඳව වූ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය

***2011 සැප්තැම්බර් 23 වැනිදා, කොළඹ, ශ්‍රී ලංකාව :*** රැඳවියන්, 'යටත් වූවන්' සේ සැලකෙන අය හා පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් වූ ඒවා වැනි ඉතාම පුළුල් ලෙස භාවිත වූ හදිසි අවස්ථා රෙගුලාසි ගණනාවක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ රෙගුලාසි වල ආකාරයෙන් දිගටම පවත්වාගෙන යාමට රජය විසින් ගෙන ඇති තීරණය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් හෙළාදකී. හදිසි නීති තත්ත්වය සඳහා තවදුරටත් අවශ්‍යතාවයක් නොපවතින බවට ජනාධිපති වරයා විසින් ප්‍රකාශ කොට සතියකට මදක් වැඩි කාලයක් ගතවෙද්දී මේ ආකාරයේ රෙගුලාසි නැවත හඳුන්වාදීම වංක වූවක් මෙන්ම ජනාධිපති වරයා විසින් පාර්ලිමේන්තුව වෙත දෙනු ලැබූ ප්‍රතිඥාවන් හා නොගැලපෙන්නක් වන බව ද අපි විශ්වාස කරමු. තවදුරටත් එමගින්, හදිසි නීති තත්ත්වය ඉවත් කිරීම තුළ ''ප්‍රජාතන්ත්‍රවාදී ලෙස හා සාමාන්‍ය නීතිය යටතේ'' රටෙහි වැඩ කටයුතු සිදුවනු ඇතැයි විශ්වාස කිරීමට පෙලඹුණු පොදු ජනතාව කළකිරීමට පත්වනු ඇතැයිද කිවයුතුව තිබේ.

මෙහිදී සිදුව ඇත්තේ හදිසි අවස්ථා රෙගුලාසි වෙනුවට ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ රෙගුලාසි නම් වූ ප්‍රායෝගික විධික්‍රමය ආදේශ කරනු ලැබීමක් බව පෙනී යයි. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කරනු ලබන තාක්කල්, හදිසි නීති තත්ත්වය අවසන් කිරීම මඟින් පමණක්ම මානව හිමිකම් ආරක්ෂා කිරීම පිළිබඳව වූ තත්ත්වයෙහි වැඩි දියුණු වීමක් පිළිබඳව සහතිකයක් නොලැබෙන බවට දීර්ඝ කාලයක් තිස්සේ සිවිල් සමාජය විසින් පලකළ සැක සංකාවන් මෙහිදී තහවුරු වී ඇත. මෙම තත්ත්වය විශේෂයෙන්ම සුළු ජන කොටස් හා රටේ උතුරු නැගෙනහිර වාසය කරන ජනතාව සම්බන්ධයෙන් බලපාන්නක් බව කිවයුතුව ඇත. 2011 අගොස්තු 29 වන දා මධ්‍යම රාත්‍රියෙහි එනම් හදිසි නීති තත්ත්වය අවලංගු වීමට පැය 24කට පෙර මෙම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ නව රෙගුලාසි බලපැවත්වීම ඇරඹුණු බව මෙහිදී අපගේ විශේෂ අවධානයට යොමු වෙයි. රජය විසින් හදිසි නීති තත්ත්වය අවසන් කිරීම ප්‍රකාශයට පත්කරන අවස්ථාවේදී වුවද හදිසි නීතීන් ලිහිල් කිරීමේ අදහසක් රජය වෙත කිසි විටකත් නොපවතින්නට ඇති බවට වන කනස්සල්ල දනවනසුළු වන නමුත් ආකර්ශනීය ද වන දර්ශකයක් මෙ මඟින් සැපයේ.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ නව රෙගුලාසි සඳහා අවශ්‍ය වන පුළුල් විධායක නීති සම්පාදන බලය, ආරක්ෂක ඇමතිවරයාට රෙගුලාසි සම්පාදනයේ බලය ලබාදෙන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 27 වැනි වගන්තිය මඟින් ලබා නොදිය යුතු බවට වන කරුණ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙහිලා ඉස්මතු කොට දක්වයි. නව රෙගුලාසිවලට ඇතුළත් වන පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් වන ඒවා  වැනි බොහෝ කරුණු හා විෂයයන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට දුරින් හෝ සම්බන්ධ නොවන බැවින් ද, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අවසර ලැබෙන දේ ද නොතකා පෙර පැවති හදිසි අවස්ථා රෙගුලාසි භාවිත කිරීම දීර්ඝ කර ගැනීමට බලාපොරොත්තු වන ආකාරය අනුව ද පෙනී යන්නේ මෙම රෙගුලාසීන් නීති විරෝධී වන බවයි.

එබැවින් අගෝස්තු 29 වන දින ප්‍රකාශය පත්කිරීමට යෙදුනු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතෙහි රෙගුලාසීන් වහාම අහෝසි කරන ලෙසත් අවසන් වූ හදිසි අවස්ථා රෙගුලාසි යටතේ රඳවාගෙන සිටි අයවලුන් සහ ආරක්ෂක අංශවලට යටත් වූ අයවලුන් නිදහස් කරන ලෙසත්, පළාත් පාලන ආයතන වල පරිපාලනයට මැදිහත් වීමෙන් වළකින ලෙසත් හා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීමට පියවර ගන්නා ලෙසත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයෙන් ඉල්ලා සිටී. එමෙන්ම අවලංගු වූ හදිසි අවස්ථා රෙගුලාසි යටතේ

එවකට අධි ආරක්ෂිත කලාප ලෙස වෙන් කොට තිබූ ප්‍රදේශයන් සම්බන්ධයෙන් පනවා තිබූ සීමාවන් දිගටම පැවැතීම සඳහා දැන් නෛතික පදනමක් නොපවතී. එබැවින් එම සීමාවන් වහාම ඉවත් කරන ලෙස ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයෙන් ඉල්ලා සිටී.

###s

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) පිහිටුවනු ලැබුයේ ශ්‍රී ලංකාවේ ගැටුම් පරිවර්තනය හා යහපාලනය සඳහා ආයතනයන් ශක්තිමත් කිරීමේ හා හැකියා වර්ධනයේ හදිසි අවශ්‍යතාවයක් පවතින බවට හා පක්ෂවාදී නොවන සිවිල් සමාජ කණ්ඩායම් විසින් මෙම ක්‍රියාදාමය වෙත ඉටුකළ යුතුවූ වැදගත් සහ නිර්මාණශීලී දායකත්වයක් පවතින බවට වූ දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙනය. රාජ්‍ය ප්‍රතිපත්ති විෂයයයෙහිදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙතින් බලාපොරොත්තු වන්නාවූ ප්‍රධාන භූමිකාව පූර්වක්‍රියාකාරී හා මැදිහත්කාරක එකක් වන අතර හිංසාවෙන් තොරවූ ගැටුම් නිරාකරණය හා ප්‍රජාතන්ත්‍රික රාජ්‍යකරණය සඳහා වූ ප්‍රතිපත්ති විකල්පයන් ව්‍යාප්ත කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලපෑම් කිරීම ඉලක්ක කොට ගත්තක් වෙයි. ඒ අනුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ කාර්යයන් හට, බලපෑම් කරනු ලබන ප්‍රතිපත්ති විකල්පයන් හඳුනාගන්නාවූ හා වර්ධනය කරන්නාවූ ප්‍රධාන පර්යේෂණ සංඝටකයක්ද ඇතුළත් වේ.

වැඩිදුර තොරතුරු සඳහා http://cpalanka.org යන අපගේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.